12641

AL/2024/52/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

| | | |
|---|---|---|
| **නර්තනය - (දේශීය) I**<br>நடனம் - (தேசிய) I<br>Dancing - (Indigenous) I | **52 S I** | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

විභාග අංකය : ...........................................

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා**

| පිටු අංකය | ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|---|
| 01 | 01 - 03 | |
| 02 | 04 - 11 | |
| 03 | 12 - 21 | |
| 04 | 22 - 35 | |
| 05 | 36 - 43 | |
| 06 | 44 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති/ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

**උපදෙස්:**

- ※ ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.
- ※ එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** කි.

- අංක **01** සිට **25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ ලියන්න.**

**1.** ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු විමසීමේ දී වැදගත් වන්නේ,
(1) සාහිත්‍ය මූලාශ්‍රය සහ පුරාවිද්‍යා මූලාශ්‍රය ය.
(2) සාහිත්‍ය මූලාශ්‍රය සහ රූකම් ය.
(3) ලිඛිත මූලාශ්‍රය සහ සෙල්ලිපි ය.
(4) මහාවංශය සහ ගල් කැටයම් ය.
(5) සංදේශ කාව්‍ය සහ ගුහා චිත්‍ර ය. (.........)

**2.** වන්නම්/සින්දු වන්නම් නර්තනය කිරීම මගින්,
(1) වාදනය අනුව ගායනය කිරීමේ හැකියාව ලැබේ.
(2) සාම්ප්‍රදායික ගායන පිළිබඳ අවබෝධය ලැබේ.
(3) ගායනය සමග නර්තනය කිරීමේ හැකියාව ලැබේ.
(4) නර්තනය හා තාල කුසලතාව වර්ධනය වේ.
(5) වන්නම්වල ව්‍යුහාත්මක ලක්ෂණ අවබෝධ වේ. (.........)

**3.** පහතරට නර්තන සම්ප්‍රදාය හා බැඳි පැනීම්, කැරකීම් ශිල්ප ක්‍රම ලෙස සැලකෙන්නේ,
(1) බඹරවළල්ල, ආසුව සහ පසු කැරකීම් ය.
(2) බඹරවළල්ල, පතහවිස්ස සහ ඉහළ කැරකීම් ය.
(3) මාලක්කම, බඹරවළල්ල සහ පතහවිස්ස ය.
(4) මාලක්කම, පිනුම් සහ ඉදිරි කැරකීම් ය.
(5) පිනුම්, බඹරය සහ ආසුව ය. (.........)

[දෙවැනි පිටුව බලන්න.

**4.** කරුණ, රෞද්‍ර සහ වීර යන රස නිෂ්පන්න කරන්නා වූ භාවයන් වන්නේ,
(1) ශෝක, ක්‍රෝධ සහ උත්සාහයි. (2) ශෝක, භය සහ උත්සාහයි.
(3) ශාන්ත, ක්‍රෝධ සහ විස්මයයි. (4) ශාන්ත, ක්‍රෝධ සහ උත්සාහයි.
(5) විස්මය, භය සහ ශෝකයි. (.........)

**5.** "උපන් පළමු එකවර ඇති කරපු මව් මරා ..." මෙම කවිය අයත් වන්නේ,
(1) කලු යකාට ය. (2) තොට යකාට ය.
(3) අභිමානාට ය. (4) රීරි යකාට ය.
(5) සූනියම් යකාට ය. (.........)

**6.** මුදලි කෝලමට අයත් "ගත ගුම් ......" යන බෙර පදය භාවිත කෙරෙන ප්‍රකට නර්තනාංග දෙකකි.
(1) නාරිලතා සහ ගිරිදේවි (2) නාග කන්‍යා සහ නාග රාක්ෂ
(3) නාග කන්‍යා සහ ගිරිදේවි (4) නාග කන්‍යා සහ සුරඹාවල්ලිය
(5) දරු නැලවිල්ල සහ නාරිලතා (.........)

**7.** තාලය තැබීමේ කාර්යයට ක්‍රමවත් බවක් ගෙන දුන් ඝන වර්ගයට අයත් තාල වාද්‍ය භාණ්ඩ වන්නේ,
(1) කයිපුඩිවළල්ල, ගෙජ්ජි සහ තාලම්පට ය. (2) තාලම්පට, තලිය සහ ගෙජ්ජි ය.
(3) තම්මැට්ටම, ගෙජ්ජි සහ සිම්බල් ය. (4) තාලම්පට, පන්තේරුව සහ හොරණෑව ය.
(5) තාලම්පට, තලිය සහ කයිපුඩිවළල්ල ය. (.........)

**8.** "අක්කා ඉතින් නාඩන්නේ – එක්ව ගොසින් අපි එන්නේ" යන කොහොඹාහැල්ලේ කවිය සම්ප්‍රදායානුකූලව ගායනය කරනු ලබන්නේ,
(1) මැදුම් තනිතිතට ය.
(2) සුළු මැදුම් දෙතිතට ය.
(3) මැදුම් මහ දෙතිතට ය.
(4) දෙසුළු මැදුම් තුන් තිතට ය.
(5) තුන්සුළු මැදුම් සිව් තිතට ය. (.........)

**9.** බෙර උපත් කවි අනුව ගැටබෙරය සඳහා භාවිත දැව වර්ග වන්නේ,
(1) මහෝගනී, කොහොඹ සහ වරකා ය. (2) ඇහැළ, කොහොඹ සහ කරඳ ය.
(3) ගංසූරිය, කොහොඹ සහ සූරියමාර ය. (4) කොස්, ඇහැළ සහ කිතුල් ය.
(5) ඇහැළ, කොහොඹ සහ වරකා ය. (.........)

**10.** පහත දැක්වෙන නර්තන / වාදන අවස්ථාවන්හි දී දැතින් අල්ලාගෙන සිටින ඇඳුම් පැළඳුම් / උපකරණ පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.





(1) ගොක්වරල, උල්උඩය සහ කඩුප්පු
(2) හවරිය, නරු සහ කඩිප්පු
(3) පිටවරල, නරු සහ කඩිප්පු
(4) පිටවරල, පොත්පොට සහ කඩිප්පු
(5) කොණ්ඩය, නරු සහ කඩුප්පු (.........)

**11.** සබරගමු නර්තන සම්ප්‍රදායේ ගී මඩු ශාන්තිකර්මයේ දී ගායනයට සම්බන්ධ කර ගන්නා විශේෂ වාද්‍ය භාණ්ඩය වන්නේ,
(1) ගැටබෙරයයි. (2) පන්තේරුවයි.
(3) රබානයි. (4) උඩැක්කියයි.
(5) බුම්මැඩියයි. (.........)

**12.** තාලය පිළිබඳ විවිධ අර්ථකථන ඉදිරිපත් කර ඇති පඬිවරුන්ගේ නම් ඇතුළත් වරණය කුමක් ද?
(1) අමරසිංහ ආචාර්ය සහ රංගදේව
(2) අමරසිංහ ආචාර්ය සහ අභිනව ගුප්ත
(3) අභිනව ගුප්ත සහ ධනවර්ධන ගුප්ත
(4) නන්දිකේශ්වර සහ ඇරිස්ටෝටල්
(5) සාරංගදේව සහ ආනන්ද සාගර (.........)

**13.** වඩාත් නිවැරදි වරණය තෝරන්න. ප්‍රස්තාරකරණයේ දී,
(1) ක්ෂනාන්ත සහ හීනාන්ත වැදගත් නොවේ.
(2) තිත් තෙයි යන ආඝාත හඳුනාගත යුතු ය.
(3) යතිය සටහන් කිරීමට '+' සංකේතය භාවිත වේ.
(4) අවග්‍රහය සටහන් කිරීමට '–' සංකේතය භාවිත වේ.
(5) මාත්‍රා කැටි දැක්වීම සඳහා අඩ රවුම භාවිත වේ. (.........)

**14.** මාත්‍රා $2 + 3$ වශයෙන් විභාග වී ඇති හින්දුස්ථානි තාල රූපය කුමක් ද?
(1) ජප් තාලය (2) ත්‍රිතාලය
(3) දාදරා තාලය (4) දීප්චන්දි තාලය
(5) ධමාර් තාලය (.........)

**15.** "අර බලන්න ඉර ගිරවිගෙ පැටියෝ" මෙහි ලඝු ගුරු මාත්‍රා සංඛ්‍යාව
(1) ලඝු 11 ගුරු 02 (2) ලඝු 13 ගුරු 04
(3) ලඝු 12 ගුරු 03 (4) ලඝු 12 ගුරු 04
(5) ලඝු 12 ගුරු 02 (.........)

**16.** පහත දැක්වෙන්නේ කුමන වර්ගයේ කවියක් ද?
තුඹසක මැටි රැගෙන - කිරි පැන් හඳුන් සමඟින
ඒ මැටි අනාගෙන - තබව් බලියට නිති ලකුණ දැන
(1) මැටි පදම් කිරීමේ කවියකි. (2) හිං හතර කවියකි.
(3) බලි පාවාදීමේ කවියකි. (4) බලි මැස්සේ කවියකි.
(5) බලි ඇඹුම් කවියකි. (.........)

**17.** රූපණ විධි ක්‍රමයෙහි (Method of Acting) මූලික සිද්ධාන්තය හඳුන්වා දුන්නේ,
(1) ඇනා පැව්ලෝවා ය. (2) චෙකොව්ස්කි ය.
(3) ස්ටැනිස්ලාවුස්කි ය. (4) මාරියස් පෙටිපා ය.
(5) වස්ලව් නිජින්ස්කි ය. (.........)

**18.** වෙස් ඇඳුම් කට්ටලයට පමණක් අයත් රංගවස්ත්‍රාභරණ වන්නේ,
(1) උල්උඩය, පායිම්පත සහ අත්පොට ය.
(2) අවුල්හැරය, ශිඛාබන්දනය සහ කයිමෙත්ත ය.
(3) ඉණ හැඩය, නෙත්තිමාලය සහ කාඟුල් ය.
(4) පොත්පොට, කාඟුල් සහ අවුල්හැරය ය.
(5) පබළු හැට්ටය, ඉණ හැඩය සහ ශිඛාබන්දනය ය. (.........)

**19.** කර්ණාටක සංගීතයට අනුව නර්තනය සිදු කරනු ලබන භාරතීය සම්ප්‍රදායන් දෙක වන්නේ,
(1) භරත සහ කථක් ය. (2) කථක් සහ මනිපුරී ය.
(3) මනිපුරී සහ කථකලි ය. (4) කථකලි සහ භරත ය.
(5) භරත සහ මනිපුරී ය. (.........)

**20.** හවරිය, පනාව, කැඩපත, මාල, වළලු ආදී රංගෝපකරණ භාවිතයට ගන්නා නර්තනාංගය වන්නේ,
(1) කපුයක්කාරියයි. (2) දොළහ පෙළපාළියයි.
(3) වඩිග පටුනයි. (4) දරු නැළවිල්ලයි.
(5) නානුමුරයයි. (.........)

**21.** මනිපුරී නර්තන සම්ප්‍රදායේ 'රාස්ලීලා' නර්තනයෙහි ප්‍රධාන දේව චරිතය වන්නේ,
(1) ඊශ්වර ය. (2) විෂ්ණු ය.
(3) කෘෂ්ණ ය. (4) පාර්වතී ය.
(5) ශිව ය. (.........)

[හතරවැනි පිටුව බලන්න.

**22.** නිර්මාණාත්මක රංගාභරණ සකස් කර ගැනීම සඳහා අද්‍යතනයේ වැඩි වශයෙන් භාවිත අමුද්‍රව්‍ය වන්නේ,
(1) කාඩ්බෝඩ් ය. (2) රබර් ෂීට් ය.
(3) කඩදාසි ය. (4) හාඩ්බෝඩ් ය.
(5) පල්ප් ය. (.........)

**23.** හටන් කවි පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) මහනුවර යුගයේ මුල් කාලයේදී ආරම්භ විය.
(2) රාජ සභාව අතිශයෝක්තියෙන් වර්ණනා කර ඇත.
(3) මුල්ම හටන් කවි රචකයා අලගියවන්න මුකවෙටි ය.
(4) කරුණ රසය මුඛ්‍ය රසය වේ.
(5) ඉංග්‍රීසි හටන පළමු හටන් කාව්‍ය වේ. (.........)

**24.** මුහුණෙහි උපාංග මතුකර දැක්වීමට භාවිත කළ හැකි ආලේපන වර්ග දෙකක් වන්නේ,
(1) ස්පිරිට් ගම් (Spritgum) සහ ක්‍රීම් (Cream) ය.
(2) පැන් කේක් (Pan cake) සහ හයිලයිට් කලර්ස් (Highlight colours) ය.
(3) අයි ලෑෂස් (Eye lashes) සහ අයි ලයිනර් (Eye liner) ය.
(4) ස්පිරිට් ගම් (Spritgum) සහ පැන් කේක් (Pan cake) ය.
(5) හෙයා ස්ප්‍රේ (Hair spray) සහ මස්කාරා (Mascara) ය. (.........)

**25.** "භරත සතර පෙර ඉසිවර කී ලෙසට ......" මෙම කවිය ඇතුළත් වන්නේ කුමන සංදේශයක ද?
(1) මයුර සංදේශය (2) සැලළිහිණි සංදේශය
(3) කෝකිල සංදේශය (4) සැවුල් සංදේශය
(5) හංස සංදේශය (.........)

● අංක **26** සිට **35** තෙක් දී ඇති එක් එක් වාක්‍යයේ හිස්තැනට වඩාත් සුදුසු වචන/වචනය යොදන්න.

**26.** නර්තන ඉතිහාසය පිළිබඳ විමසීමේදී පොළොන්නරු යුගයේ ................................ ආගමික බලපෑම වැඩි වශයෙන් සිදුව ඇති බවට සාක්ෂ්‍ය හමුවේ.

**27.** 'කව් සිළුමිණ' නම් මහා කාව්‍ය රචනා කරන ලද්දේ ................................ රජතුමා විසිනි.

**28.** "මැද පෙති පසෙක වට රුස්තරු වළල්ලා – ඒ වටකර සැදි බෝතුරු වළල්ලා ......"
මෙම කවි පෙළ මගින් වලියක් මංගල්‍යයේ ................................ නම් සැරසිල්ල නිර්මාණය කරගන්නා අයුරු විස්තර කෙරේ.

**29.** තේ දලු නෙළීම ඇසුරින් ද්‍රවිඩ ජනයා ................................ ගැමි නැටුම නිර්මාණය කරගෙන ඇත.

**30.** ථූපාරාමයේ නිදන් කිරීම සඳහා ඇතෙකු පිට ධාතු වැඩම කරවීමේදී අනේක තාලාවචරයින් ඇතා පිරිවරන ලද බව ................................ නම් ග්‍රන්ථයේ සඳහන් වේ.

**31.** ශ්‍රී ලාංකේය මුද්‍රානාට්‍ය කලාවේ වේදිකා පසුතල හා රංගවස්ත්‍රාභරණ නිර්මාණයන්හි පුරෝගාමී චරිතයක් ලෙස ................................ මහතා හැඳින්විය හැකි ය.

**32.** ශාන්තිකර්මවලදී තුනුරුවන් හා දෙවියන් විෂයෙහි අත්‍යවශ්‍ය පූජා ද්‍රව්‍ය තැන්පත් කිරීම උදෙසා ඉදිකෙරෙන සැරසිල්ල ................................ නමින් හැඳින්වේ.

**33.** අපරදිග බැලේ රංග කලාව, ශ්‍රී ලංකාවේදී මුද්‍රා නාට්‍ය සහ ................................ යන නම්වලින් ප්‍රචලිත විය.

**34.** ගායනය, වාදනය, අංගරචනය, රංගවස්ත්‍රාභරණ සහ පසුබිම් අලංකරණය යන ................................ කලා මගින් ප්‍රාසංගික නිර්මාණ වර්ණවත් කරයි.

**35.** භරත නාට්‍යයම්හි දේවදාසින් පුහුණු කරවන්නා ................................ නමින් හඳුන්වනු ලැබේ.

● අංක **36** සිට **50** තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **තිත් ඉර** මත ලියන්න.

**36.** පොළොන්නරු යුගයේදී නළලෙහි සලකුණු තබා දේවාල චාරිත්‍ර සඳහා පූජා කළ දේවදාසීන් ගණන සහ එය සඳහන් සෙල්ලිපිය කුමක් ද?


(i) දේවදාසින් ගණන : ..........................................

(ii) සෙල්ලිපිය : ..........................................

**37.** පහත **A** සහ **B** මගින් දැක්වෙන භාරතීය වාද්‍ය භාණ්ඩ **දෙක** නම් කරන්න.



**A**



**B**

(i) **A** : ..............................................

(ii) **B** : ..............................................

**38.** 'මහබෝ වන්නම' රචනය සහ ගායනය කළ ශිල්පීන් දෙදෙනා නම් කරන්න.

(i) රචකයා : ..............................................

(ii) ගායකයා : ..............................................

**39.** රංගනයේදී එක් ස්ථානයක රැඳී සිටිමින් සහ ගමන් කරමින් සිදු කරන චලන හඳුන්වන නම් ලියා දක්වන්න.

(i) එක් ස්ථානයක රැඳී සිටිමින් : ..........................................

(ii) ගමන් කරමින් : ..........................................

**40.** අච්චන් මහරාජ් විසින් වේදිකාවට නිර්මාණය කළ කථක් නර්තන අංග **දෙක** මොනවා ද?

(i) ..................................................................

(ii) ..................................................................

**41.** අතීතයේදී දළදා පෙරහර නිම කිරීමෙන් පසු චාරිත්‍රානුකූලව ඒ පිළිබඳ වාර්තා කළේ කවු ද? කා හට ද?

(i) කවු ද? : ..............................................

(ii) කා හට ද? : ..............................................

**42.** ආලෝකකරණයේදී භාවිත ප්‍රධාන වර්ණ ප්‍රභේද **දෙක** නම් කරන්න.

(i) ..................................................................

(ii) ..................................................................

**43.** උඩරට යක්කමේ භාවිත රංගෝපකරණ **දෙක** නම් කරන්න.

(i) ..................................................................

(ii) ..................................................................

**44.** පහත දැක්වෙන රූපයේ මුඛයෙහි රඳවාගෙන ඇති පන්දම හඳුන්වන නාමය සහ එම නර්තනය අයත් ශාන්තිකර්මයක් නම් කරන්න.



(i) පන්දම හඳුන්වන නාමය : ..........................................

(ii) ශාන්තිකර්මය : ..........................................

**45.** "අඳිමින් සුදු සළු පට ගෙල සඳුනෙන් තුණු තවරා ......" යන කවිය අයත් සංදේශ කාව්‍යය සහ එය ලියැවී ඇති යුගය නම් කරන්න.

(i) සංදේශ කාව්‍යය : ................................................

(ii) යුගය : ................................................

**46.** කුල්ලේ පිදේනිය සහ ආඬිගුරු නැටීම අයත් ශාන්තිකර්ම **දෙක** නම් කරන්න.

(i) කුල්ලේ පිදේනිය : ................................................

(ii) ආඬිගුරු නැටීම : ................................................

**47.** තිල්ලානා නර්තනාංගය අයත් නර්තන සම්ප්‍රදාය සහ එය හඳුන්වා දුන් ශිල්පියා සඳහන් කරන්න.

(i) නර්තන සම්ප්‍රදාය : ................................................

(ii) ශිල්පියා : ................................................

**48.** වෙස් මෝස්තර රචනයට අයත් ප්‍රධාන කොටස් **දෙක** නම් කරන්න.

(i) ..........................................................................

(ii) ..........................................................................

**49.** වවුන්න, වලුකුර, වෙල්ලිය ආදී රංගෝපකරණ භාවිත ශාන්තිකර්මය සහ පෙළපාලි අංගය කුමක් ද?

(i) ශාන්තිකර්මය : ................................................

(ii) පෙළපාලි අංගය : ................................................

**50.** "සියොපත් පතිනේ දිගු නුවනතිනේ" මෙම කවිය අයත් ශාන්තිකර්මය සහ නර්තනාංගය නම් කරන්න.

(i) ශාන්තිකර්මය : ................................................

(ii) නර්තනාංගය : ................................................

* * *

12641

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

නර්තනය - (දේශීය) II
நடனம் - (தேசிய) II
Dancing - (Indigenous) II

52 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය **I, II** හා **III** වශයෙන් කොටස් **තුනකින්** සමන්විත වේ.
* **I** කොටසේ **1** හා **2** ප්‍රශ්න අනිවාර්ය වේ.
* **II** හා **III** කොටස්වලින් **අවම වශයෙන් එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, අනිවාර්ය ප්‍රශ්න **දෙක** ද ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සැපයිය යුතු ය.
* සෑම ප්‍රශ්නයකම **(i)** කොටසට ලකුණු **06**ක් ද **(ii)** කොටසට ලකුණු **06**ක් ද **(iii)** කොටසට ලකුණු **08**ක් ද වශයෙන් මුළු ලකුණු **20**ක් බැගින් හිමි වේ.

## I කොටස

**1.** (i) පහත සඳහන් බෙර පද අතුරෙන් ඔබ උගත් සම්ප්‍රදායට අයත් බෙරපදය තෝරාගෙන මැදුම් තනිතිතට අනුව සමගුණ, දෙගුණ හා සිව්ගුණයට ප්‍රස්තාරගත කරන්න.

(අ) තකට කුඳට

(ආ) ගුහිති ගහිති

(ඉ) තකට ජිකට

(ii) පහත සඳහන් කවි පදය අවග්‍රහයෙන් ආරම්භ කර මහතනිතිතට ප්‍රස්තාරගත කරන්න.

"සැපත පැමිණි මුළු ලොවට සියල්ලේ – ලොවට සියල්ලේ"

(iii) උකුසා වන්නමේ කස්තිරම හෝ සෙබළුවෙච්චි තාලය සින්දු වන්නමේ ඉරට්ටිය හෝ ආනන්ද වන්නමේ අඩව්ව හෝ ප්‍රස්තාරගත කරන්න.

**2.** (i) යාපහුව මාළිගයේ රූකම් මගින් තත්කාලීන නර්තන කලාවේ ස්වභාවය ප්‍රකට කරයි. සාධක **දෙකක්** මගින් විස්තර කරන්න.

(ii) ක්‍රි.ව. 1970 සිට 1990 දක්වා නර්තන අධ්‍යාපනයේ ප්‍රවර්ධනයට බලපෑ සාධක **තුනක්** පිළිබඳ පැහැදිලි කරන්න.

(iii) කාන්තා නර්තනයේ විචිත්‍රත්වය කෝට්ටේ යුගයේ රචිත ගුත්තිල කාව්‍ය සහ සැළලිහිණි සංදේශය ඇසුරෙන් **උදාහරණය බැගින්** ගෙන ඇගයීමක් කරන්න.

## II කොටස

**3.** (i) අංකෙළි උපත හා බැඳි ශාන්තිකර්මය නම් කොට එහි පුරාවෘත්තය විස්තර කරන්න.

(ii) "පහතරට සම්ප්‍රදායේ රංග භාණ්ඩ විචිත්‍රවත් මෙන්ම කලාත්මක අගයෙන් ද පරිපූර්ණ වේ" කපුයක්කාරියෙහි රංග භාණ්ඩ **දෙකක්** ඇසුරෙන් ඉහත කියමන පහදන්න.

(iii) සන්නි යකුමේ වෙස් මුහුණු සහ රංග වස්ත්‍රාභරණ භාවිතයෙහි විශේෂතා සූනියම් යක්ෂණියගේ චරිතය ඇසුරෙන් විග්‍රහ කරන්න.

[දෙවැනි පිටුව බලන්න.

4. (i) පොත්කඩේ යක්කම ඇසුරෙන් සන්නිවේදනය වන සමාජ සාරධර්ම **දෙකක්** විස්තර කරන්න.
   (ii) බලි උපත් කතා **දෙකක්** නම් කොට බලි ශාන්තිකර්මය පැවැත්වීමේ අවස්ථා **දෙකක්** පිළිබඳ පැහැදිලි කරන්න.
   (iii) රීරියක් චරිත නිරූපණයේ නාට්‍යමය ලක්ෂණ **හතරක්** ඇසුරෙන් රස නිෂ්පත්තිය විමසුමට ලක් කරන්න.

5. (i) පතල් කවි පිළිබඳ හැඳින්වීමක් කර එම කවි භාවිතයෙන් නිර්මාණය වී ඇති ගැමි නැටුම පිළිබඳ විස්තරයක් කරන්න.
   (ii) නොංචි චරිතය නිර්මාණය සඳහා ගායනා සහ නර්තන උපයෝගි කරගෙන ඇති අයුරු පහදන්න.
   (iii) අද්‍යතනයේ දැකිය හැකි බොහෝ ගැමි නැටුම් එහි මූලික ලක්ෂණ අතික්‍රමණය කරයි. පහත තේමා යටතේ පැහැදිලි කරන්න.
   (අ) රංගවින්‍යාස සහ ඇඳුම් පැළඳුම්
   (ආ) ගායන හා වාදන

## III කොටස

6. පහත සඳහන් වගුවෙහි **(අ)**, **(ආ)** සහ **(ඉ)** යන කොටස්වලට අදාළව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| (අ) කොටස | (ආ) කොටස | (ඉ) කොටස |
|---|---|---|
| පදම් | චෙන්ඩා | නට්ක්‍රැකර් |
| වර්ණම් | කෝල් | හංසවිල |
| තිල්ලානා | මෘදංගම් | ගිසෙල්ලි |
| ශබ්දම් | තබ්ලා | නිදි කුමරිය |

   (i) **(අ)** කොටස - භරත නාට්‍යම් නර්තන සම්ප්‍රදායට අයත් නෘත්ත ලක්ෂණ ඇති නර්තන අංගය තෝරාගෙන එහි විශේෂතා පැහැදිලි කරන්න.
   (ii) **(ආ)** කොටස - කථක් නර්තන සම්ප්‍රදායෙහි භාවිත අවනද්ධ වාද්‍ය භාණ්ඩය තෝරාගෙන එහි ව්‍යුහය පිළිබඳ විග්‍රහ කරන්න.
   (iii) **(ඉ)** කොටස - ක්‍රි.ව. 1892 දී රුසියාවේ වේදිකාගත වූ බැලේ නාට්‍ය නම් කර එහි එන සාදයට එක්වන ආගන්තුක චරිතය හා සම්බන්ධ අද්භූත සිදුවීම් විමසුමට ලක් කරන්න.

7. (i) තිත් පහන් (Spot Light) සහ අනුගාමී පහන් (Follow Light) පිළිබඳ හැඳින්වීමක් කරන්න.
   (ii) නර්තනය සඳහා අංගරචනය කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු **තුනක්** විස්තර කරන්න.
   (iii) ශෛලිගත නාට්‍ය සහ තාත්වික නාට්‍ය ශෛලීන්හි සමවිෂමතා කරුණු **හතරක්** ඇසුරෙන් විමසුමට ලක් කරන්න.

8. (i) "අද්‍යතන රියැලිටි නර්තන නිර්මාණ මගින් පුද්ගල රසඥතා වර්ධනය සිදුවේ ද?" ඔබගේ අදහස් දක්වන්න.
   (ii) රූපවාහිනී මාධ්‍යයන්හි වෙළඳ දැන්වීම් සඳහා නර්තනය යොදාගෙන ඇති අයුරු උදාහරණ **දෙකක්** ඇසුරෙන් සාකච්ඡා කරන්න.
   (iii) ශාස්ත්‍රීය නර්තනය ආරක්ෂා කරගැනීම උදෙසා සමාජ මාධ්‍ය මගින් ඔබට ඉටුකළ හැකි කාර්යයන් **හතරක්** විමසන්න.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2024

# 52 - නර්තනය

### ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2024

## 52 - නර්තනය

## ප්‍රශ්නපත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදීයාම

### I පත්‍රය

කාලය පැය 02 යි.

වරණ 5 න් යුත් බහුවරණ ප්‍රශ්න 25 ක් හා කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 25 කි.

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ප්‍රශ්න 50 කි. (50 x 02) මුළු ලකුණු 100 කි.

### II පත්‍රය

කාලය පැය 03 යි.

මෙම ප්‍රශ්න පත්‍රය I, II හා III වශයෙන් කොටස් තුනකින් සමන්විත වේ.

I කොටස - රචනා වර්ගයේ ප්‍රශ්න 02 කි.
1 හා 2 ප්‍රශ්න අනිවාර්ය වේ.

II කොටස - රචනා වර්ගයේ ප්‍රශ්න 03 කි
අවම වශයෙන් එක් ප්‍රශ්නයකටවත් පිළිතුරු සැපයිය යුතුය.

III කොටස - රචනා වර්ගයේ ප්‍රශ්න 03 කි.
අවම වශයෙන් එක් ප්‍රශ්නයකටවත් පිළිතුරු සැපයිය යුතුය.

II හා III කොටස්වලින් අවම වශයෙන් එක් ප්‍රශ්නය බැගින් හෝ තෝරාගෙන, අනිවාර්යය ප්‍රශ්න 02 ද ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුය.

සෑම ප්‍රශ්නයකම (i) කොටසට ලකුණු 06 ක්ද (ii) කොටසට ලකුණු 06 ක්ද (iii) කොටසට ලකුණු 08 ක්ද වශයෙන් මුළු ලකුණු 20 බැගින් හිමිවේ.

| | |
|---|---|
| පළමු පත්‍රය (ප්‍රශ්න 50 x 2) | ලකුණු 100 |
| දෙවන පත්‍රය (ප්‍රශ්න 20 x 5) | ලකුණු 100 |
| I හා II පත්‍ර සඳහා 100 + 100 | ලකුණු $\frac{200}{2}$ |
| අවසාන ලකුණු | ලකුණු 100 |

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ............................................ √ △ $\frac{4}{5}$

(ii) ............................................ √ △ $\frac{3}{5}$

(iii) ............................................ √ △ $\frac{3}{5}$

03 (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.

***

**අභිමතාර්ථ -**

I වන ප්‍රශ්න පත්‍රය

01. දේශීය නර්තන කලාවේ සාම්ප්‍රදායික නර්තන, ගායන, වාදන හා තාල පද්ධතිය පිළිබඳ න්‍යායාත්මක කරුණු අවබෝධයෙන් යුතුව ප්‍රකාශ කරයි.

02. දේශීය නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු, ශාන්තිකර්මවල අනන්‍යතා ලක්ෂණ, ආගමික, සමාජීය හා සංස්කෘතික වටිනාකම අගය කරයි.

03. භාරතීය නර්තනවල සාම්ප්‍රදායික ලක්ෂණ, තාල අවබෝධය හා බටහිර බැලේ සම්ප්‍රදායෙහි විශේෂතා පිළිබඳ අවබෝධයෙන් විශ්ලේෂණය කරයි.

04. ජාතික සංස්කෘති උරුමයන් හා පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් උසස් කලාකෘති හා නිර්මාණ නම් කරයි.

05. නව නර්තන නිර්මාණ, කැටයම් කලාව ආනුෂංගික කලා පිළිබඳ වටිනාකම ප්‍රකාශ කරයි.

II වන ප්‍රශ්න පත්‍රය

01. දේශීය නර්තන කලාවේ සම්ප්‍රදායික නර්තන / ගායන, වාදන හා එහි අන්තර්ගත තාල පද්ධතිය වෙන්කොට හඳුනා ගනිමින් තාල ප්‍රස්තාරකරණය භාවිත කර විශ්ලේෂණය කරයි.

02. දේශීය නර්තන කලාවේ යුගාන්තර විකාශනය, ශාන්තිකර්ම තුලනය, ආගමික, සමාජීය හා සංස්කෘතික වටිනාකම අගය කරයි.

03. භාරතීය නර්තන සම්ප්‍රදා, බටහිර බැලේ රංගකලාව පිළිබඳ ඓතිහාසික තොරතුරු, වෙනස්කම් පිළිබඳ දැනුම, අවබෝධය හා භාවිතයෙන් විශ්ලේෂණ හැකියාව ප්‍රදර්ශනය කරයි.

04. පර්යේෂණ කෘති පරිශීලනයෙහි වටිනාකම හා නිර්මාණාත්මක නර්තන, අද්‍යතන ප්‍රාසංගික වේදිකාව හා ආනුෂංගික කලාවන් අගය කරයි.

05. ජාතික උරුම, සමාජීය පසුබිම මනා චින්තනයෙන් හා උසස් රසඥතාවයෙන් යුතුව අධ්‍යයනය කරමින් බහුවිධ සංස්කෘතිකාංගවල වටිනාකම විචාරාත්මකව විග්‍රහ කරයි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2024

| විෂය අංකය<br>பாட இலக்கம் | 52 | විෂයය<br>பாடம் | නර්තනය (දේශීය) |
|---|---|---|---|

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 4 | 21. | 3 |
| 02. | 3 | 12. | 2 | 22. | 2 |
| 03. | 3 | 13. | 2 | 23. | 3 |
| 04. | 1 | 14. | 1 | 24. | 2 |
| 05. | 4 | 15. | 5 | 25. | 4 |
| 06. | 3 | 16. | 5 | | |
| 07. | 2 | 17. | 3 | | |
| 08. | 1 | 18. | 2 | | |
| 09. | 5 | 19. | 4 | | |
| 10. | 3 | 20. | 5 | | |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 02 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் $2 \times 25 = 50$

## I පත්‍රය

26. හින්දු
27. දෙවන පරාක්‍රමබාහු
28. සොළොස්මඟල
29. කොළඹ පරිත්තාල්
30. සමන්ත පාසාදිකාව
31. සෝමබන්ධු විද්‍යාපති
32. යහන/ මල්යහන
33. ඉඟිනළු
34. ආනුෂංගික
35. නට්ටුවනාර්/ නට්ටුවන්
36. I. හත (7) II. පාලමොට්ටායි
37. I. එඩැක්ක II. මෘදංගය
38. I. ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ II. ඩබ්.ඩී. අමරදේව
39. I. ස්ථිතික චලන II. සංචාරි චලන
40. I. ථුකඩා II. පරන්
41. I. දියවඩන නිළමේ II. රජතුමාට
42. I. ද්‍රව්‍ය වර්ණ II. ආලෝක වර්ණ
43. I. ඌරු රුව II. දූන්න සහ රිය
44. I. දෙකොන විලක්කුව II. සන්නියකුම/ දහඅට සන්නිය
45. I. කෝකිල සංදේශය II. කෝට්ටේ යුගය
46. I. රටයකුම/ රිද්දියාගය II. කිරිමඩුව
47. I. භරත නාට්‍යම් II. පොන්නයියා
48. I. අංගරචනය II. රංග වස්ත්‍රාභරණ
49. I. රටයකුම/ රිද්දියාගය II. කපුයක්කාරිය
50. I. කොහොඹා කංකාරිය II. මඩුපුරය

*ප්‍රශ්න අංක 01 සිට 25 දක්වා (02 x 25) ලකුණු 50*

*ප්‍රශ්න අංක 26 සිට 50 දක්වා (02 x 25) ලකුණු 50*

*මුළු ලකුණු 100*

# I කොටස

1. (i) පහත සඳහන් බෙර පද අතුරෙන් ඔබ උගත් සම්ප්‍රදායට අයත් බෙරපදය තෝරාගෙන මැදුම් තනිතිතට අනුව සමගුණ, දෙගුණ හා සිව්ගුණයට ප්‍රස්තාරගත කරන්න.
   (අ) තකට කුදට
   (ආ) ගුහිති ගහිති
   (ඉ) තකට ජිකට

උඩරට

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | / | | | / | | | / | | | / | | |
| | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| සමගුණ | ත | ක | ට | කු | ද | ට | ත | ක | ට | කු | ද | ට |
| දෙගුණ | තක | ටකු | දට | තක | ටකු | දට | තක | ටකු | දට | තක | ටකු | දට |
| සිව්ගුණ | තකටකු | දටතක | ටකුදට | තකටකු | දටතක | ටකුදට | තකටකු | දටතක | ටකුදට | තකටකු | දටතක | ටකුදට |

නිවැරදි විභාගවලට වෙන් කිරීම හා සංකේත භාවිතයට ලකුණු 02
බෙරපදය නිවැරදිව ප්‍රස්තාර කිරීමට සමගුණ-1, දෙගුණ -1, සිව්ගුණ-2 ලකුණු 04
මුළු ලකුණු 06

පහතරට

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | / | | | / | | | / | | | / | | |
| | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| සමගුණ | ගු | හි | ති | ග | හි | ති | ගු | හි | ති | ග | හි | ති |
| දෙගුණ | ගුහි | තිග | හිති | ගුහි | තිග | හිති | ගුහි | තිග | හිති | ගුහි | තිග | හිති |
| සිව්ගුණ | ගුහිතිග | හිතිගුහි | තිගහිති | ගුහිතිග | හිතිගුහි | තිගහිති | ගුහිතිග | හිතිගුහි | තිගහිති | ගුහිතිග | හිතිගුහි | තිගහිති |

නිවැරදි විභාගවලට වෙන් කිරීම හා සංකේත භාවිතයට ලකුණු 02
බෙරපදය නිවැරදිව ප්‍රස්තාර කිරීමට සමගුණ-1, දෙගුණ -1, සිව්ගුණ-2 ලකුණු 04
මුළු ලකුණු 06

සබරගමු

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | / | | | / | | | / | | | / | | |
| | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| සමගුණ | ත | ක | ට | ජි | ක | ට | ත | ක | ට | ජි | ක | ට |
| දෙගුණ | තක | ටජි | කට | තක | ටජි | කට | තක | ටජි | කට | තක | ටජි | කට |
| සිව්ගුණ | තකටජි | කටතක | ටජිකට | තකටජි | කටතක | ටජිකට | තකටජි | කටතක | ටජිකට | තකටජි | කටතක | ටජිකට |

නිවැරදි විභාගවලට වෙන් කිරීම හා සංකේත භාවිතයට ලකුණු 02
බෙරපදය නිවැරදිව ප්‍රස්තාර කිරීමට සමගුණ-1, දෙගුණ -1, සිව්ගුණ-2 ලකුණු 04
මුළු ලකුණු 06

(ii) පහත සඳහන් කවි පදය අවග්‍රහයෙන් ආරම්භ කර මහතනිතිතට ප්‍රස්තාරගත කරන්න.
"සැපත පැමිණි මුළු ලොවට සියල්ලේ – ලොවට සියල්ලේ"

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| / | | | | / | | | | / | | | | / | | | |
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| + | සැප | ත | පැ | මි | ණි | මු | ළු | ලො | ව | ට | සි | යල් | - | ලේ | - |
| + | + | ලො | ව | ට | - | සි | - | යල් | - | - | - | ලේ | - | - | - |

නිවැරදි විභාගවලට වෙන් කිරීම හා සංකේත භාවිතයට ලකුණු 02
කවි පදය නිවැරදිව ප්‍රස්තාර කිරීමට ලකුණු 04
මුළු ලකුණු 06

(iii) උකුසා වන්නමේ කස්තිරම හෝ සෙබළුවෙච්චි තාලය සින්දු වන්නමේ ඉරට්ටිය හෝ ආනන්ද වන්නමේ අඩව්ව හෝ ප්‍රස්තාරගත කරන්න.

උඩරට - උකුසා වන්නමේ කස්තිරම

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| / | | | | / | | | | / | | | | / | | | |
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| ත | දොං | - | දො | මි | ත | දොං | - | තක | දොං | - | දො | මි | ත | දොං | - |
| ත | දොං | - | දො | මි | ත | දොං | - | තා | - | ත | ක | ජි | ජි | කු | ද |
| තක | ටකු | දට | තක | ටකු | දට | කුඳ | කුඳ | තක | ටකු | දට | තක | ටකු | දට | කුඳ | කුඳ |
| තක | ටකු | දට | තක | ටකු | දට | කුං | දත් | රුං | තක | ජිං | තක | තරි | කිට | කුං | දත් |
| රුං | තක | ජිං | තක | තරි | කිට | කුං | දත් | රුං | තක | ජිං | තක | තරි | කිට | කුං | දත් |
| තා- | -ග | ජිං | තක | තරි | කිට | කුං | දත් | තා- | -ග | ජිං | තක | තරි | කිට | කුං | දත් |
| රුං | තක | ජිං | ජිං | තකු | තක | ජිං | ජිං | රුං | තක | ජිං | තක | තරි | කිට | කුං | දත් |
| තා- | -ග | ජිං | තක | තරි | කිට | කුං | දත් | රුං | තක | ජිං | තක | තරි | කිට | කුං | දත් |
| තා | | | | | | | | | | | | | | | |

නිවැරදි විභාගවලට වෙන් කිරීම හා සංකේත භාවිතයට ලකුණු 02
කස්තිරම නිවැරදිව ප්‍රස්තාර කිරීමට ලකුණු 06
මුළු ලකුණු 08

පහතරට - සෙබළුවෙච්චි තාලය සින්දු වන්නමේ ඉරට්ටිය

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| / | | | | / | | | | / | | | | / | | | |
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| තාම් | - | - | - | දිත් | - | තම් | - | ගත් | - | තම් | - | දි | ත | ග | ත |
| දොං | - | දොං | - | තත් | - | තත් | - | ගුහි | තිග | දිරි | කිට | තත් | - | තත් | - |
| ගුහි | තිග | දිරි | කිට | ගු | ද | ගු | ද | ගත් | - | ත | දිත් | - | ත | ග | ත |
| ගත් | - | තම් | - | දොං | - | දොං | - | තා | | | | | | | |

**(හෝ)**

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| / | | | | / | | | | / | | | | / | | | |
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| දොම් | - | - | - | දිත් | - | තම් | - | ගත් | - | තම් | - | දි | ත | ග | ත |
| දොං | - | දොං | - | තත් | - | තත් | - | ගුහි | තිග | දිරි | කිට | තත් | - | තත් | - |
| ගුහි | තිග | දිරි | කිට | ගු | ද | ගු | ද | ගත් | - | ත | දිත් | - | ත | ග | ත |
| ගත් | - | තම් | - | දොං | තග | දිත | ගුද | තා | | | | | | | |

නිවැරදි විභාගවලට වෙන් කිරීම හා සංකේත භාවිතයට ලකුණු **02**

ඉරට්ටිය නිවැරදිව ප්‍රස්තාර කිරීමට ලකුණු **06**

මුළු ලකුණු **08**

සබරගමු - ආනන්ද වන්නමේ අඩව්ව

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| / | | | | / | | | | / | | | | / | | | |
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| තත් | කඩ | තරි | කිට | ත | කු | දං | - | ත | කු | ජී | කු | ත | කු | දං | - |
| තත් | කඩ | තරි | කිට | ත | කු | දං | - | කඩ | ජිබ් | බඩ | කුං | දං | - | - | - |
| ජික් | කඩ | තරි | කිට | ත | කු | දං | - | ත | කු | ජී | කු | ත | කු | දං | - |
| ජික් | කඩ | තරි | කිට | ත | කු | දං | - | කඩ | ජිබ් | බඩ | කුං | දං | - | - | - |
| තත් | කඩ | තරි | කිට | ත | කු | දං | - | ත | කු | ජී | කු | ත | කු | දං | - |
| ජිත් | කඩ | තරි | කිට | ත | කු | දං | - | ත | කු | ජී | කු | ත | කු | දං | - |
| තත් | කඩ | තරි | කිට | ත | කු | දං | - | ජික් | කඩ | තරි | කිට | ත | කු | දං | - |
| තත් | කඩ | තරි | කිට | ජික් | කඩ | තරි | කිට | තොං | ගඩ | තරි | කිට | දොං | - | ත | ග |
| ති | ත | ග | ත | ග | ති | ග | ත | දිරි | කිට | තරි | කිට | තා | - | - | ජී |
| මිත් | - | තත් | - | ග | ති | ග | ත | දිරි | කිට | තරි | කිට | තා | | | |

නිවැරදි විභාගවලට වෙන් කිරීම හා සංකේත භාවිතයට ලකුණු **02**

අඩව්ව නිවැරදිව ප්‍රස්තාර කිරීමට ලකුණු **06**

මුළු ලකුණු **08**

**2.** (i) යාපහුව මාළිගයේ රූකම් මගින් තත්කාලීන නර්තන කලාවේ ස්වභාවය ප්‍රකට කරයි. සාධක **දෙකක්** මගින් විස්තර කරන්න.

- යාපහුවේ රජ මාලිගයෙහි පියගැටපෙළෙහි විවිධ ඉරියව් නිරූපණය කරන නර්තකයන්ගේ හා බෙර වාදකයන්ගේ රූකම් භාරතීය නර්තන අංග ලක්ෂණ දක්නට ඇති බව

- පාණ්ඩ්‍ය සම්ප්‍රදායට අනුව නිර්මාණය කර ඇති යාපහුවේ දළදා මාලිගයේ ශෛලමය සෝපාන පන්තිය දෙපැත්තේ නළු රූප මඟින් තත් කාලීන නර්තන කලාව ප්‍රචලිතව පැවති බව

- යාපහුවේ දළදා මාලිගාවේ සෙල්මුවා වාකවුළුවක ඉන්දියානු භරත නාට්‍යයම්හි කරණ විලාස කැටයම් කර ඇති බව

**ඉහත සාධක ඇසුරින්, නර්තනය ප්‍රකටව තිබූ බව, රාජ්‍ය අනුග්‍රහය, කාන්තා නර්තන දායකත්වය, භාරතීය කරණ ආභාසය, වාදන....... ආදි කරුණු දෙකක්**

**සාධක දෙකක් නිවැරදිව තෝරා ගැනීමට ලකුණු 02**
**තත් කාලීන නර්තන කලාවේ ස්වාභාවය විස්තර කිරීමට ලකුණු 04**
**මුළු ලකුණු 06**

(ii) ක්‍රි.ව. 1970 සිට 1990 දක්වා නර්තන අධ්‍යාපනයේ ප්‍රවර්ධනයට බලපෑ සාධක **තුනක්** පිළිබඳ පැහැදිලි කරන්න.

- 1972 ප්‍රතිසංස්කරණ අනුව රජයේ පාසල්වලට සෞන්දර්ය විෂය අනිවාර්ය බව
- 1972 සෞන්දර්ය ගුරුවරුන් පුහුණු කිරීම සඳහා ගිරාගම ගුරු විදුහල ආරම්භ කළ බව
- 1974 ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයට සෞන්දර්ය අධ්‍යයන ආයතනය අනුබද්ධ කළ බව
- 1975 ජා.පො.අ. සහතික පත්‍ර විභාගය ආරම්භ කළ බව
- 1976 අ.පො.ස.(උ.පෙ) විෂය ධාරාවට නර්තනය විෂයක් වශයෙන් ඇතුළත් කළ බව
- 1977 ජාතික නැටුම්/ සංගීත විභාගය නව ප්‍රතිසංස්කරණ ලෙස ආරම්භ කළ බව.
- 1979 ජා.පො.අ.ස.(H.N.C.E) විභාගයට සිසුන් පෙනී සිටි බව.
- 1982 ප්‍රථමවරට ලලිතකලා උපාධිධාරීන්ගේ උපාධිය පිරිනැමීමේ උත්සවය පැවැත් වූ බව.
- 1985 අ.පො.ස (සා.පෙ) විභාගයට විෂය නිර්දේශයක් සකස් වූ බව.
- 1985 – 1986 මීපේ සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ නර්තන කණ්ඩායම පිහිටුවා ගත් බව.

**සාධක තුනක් නිවැරදිව තෝරා ගැනීමට ලකුණු 02**
**සාධක තුනක් ඇසුරෙන් නර්තන අධ්‍යාපනයේ ප්‍රවර්ධනය සිදුවී ඇති බව පැහැදිලි කිරීමට ලකුණු 04**
**මුළු ලකුණු 06**

(iii) කාන්තා නර්තනයේ විචිත්‍රත්වය කෝට්ටේ යුගයේ රචිත ගුත්තිල කාව්‍ය සහ සැළලිහිණි සංදේශය ඇසුරෙන් **උදාහරණය බැගින්** ගෙන ඇගයීමක් කරන්න.

- ගුත්තිල කාව්‍ය මඟින් කාන්තා නර්තනයේ විචිත්‍රත්වය අතිශයෝක්තියෙන් විස්තර කර බව
  රූ රැසේ අදිනා ලෙසේ අත් ලෙල දිදී විදුලිය පබා........
- සැළලිහිණි සංදේශ කාව්‍ය මඟින් කාන්තා නර්තන විචිත්‍රත්වය විස්තර කර ඇති බව.
  විදෙන ලෙලෙන නරු බර පුළුලුකුල රැදී ...............
  ලකල පුළුලුකුල බඳ මිණි මෙවුල්ලා..........

**කාන්තාවන්ගේ අංග, ප්‍රත්‍යාංග, උපාංග නර්තන විලාස, රංගවස්ත්‍රාභරණ පිළිබඳ ඇගයීම**

**අදාළ කවි මඟින් නිවැරදිව තෝරා ගැනීමට ලකුණු(2x2) 04**
**කාන්තා නර්තනයේ විචිත්‍රත්වය ඇගයීමට ලක් කිරීමට ලකුණු 04**
**මුළු ලකුණු 08**

## II කොටස

3. (i) අංකෙළි උපත හා බැඳි ශාන්තිකර්මය නම් කොට එහි පුරාවෘත්තය විස්තර කරන්න.

- වලියක් මංගල්‍යය / වලියකුම / හද්දා වලියකුම / වලියක් තෝත්‍රය
- මලරජ තුන්කට්ටුව හා බැඳි අංකෙළි උපත (පත්තිනි දේවි සහ පාලඟ කුමරු අඹ කඩන විට පත්තිනිය සහ පාලඟගේ කෙක්ක පැටලුණු අවස්ථාව හා එකවලියට ඇදීමේ පුවත)

**ශාන්තිකර්මය නම් කිරීමට ලකුණු 02**
**පුරාවෘත්ත කතාව විස්තර කිරීමට ලකුණු 04**
**මුළු ලකුණු 06**

(ii) "පහතරට සම්ප්‍රදායේ රංග භාණ්ඩ විචිත්‍රවත් මෙන්ම කලාත්මක අගයෙන් ද පරිපූර්ණ වේ" කපුයක්කාරියෙහි රංග භාණ්ඩ **දෙකක්** ඇසුරෙන් ඉහත කියමන පහදන්න.

- කපුයන්ත්‍රය, නඩාව, වචුන්න, වෙල්ලිය, කපු ගස, වලුකුර, වලුපත, ඉද්ද, රොද්ද ආදි රංගභාණ්ඩ සඳහන් කර ඇති බව
- රංග භාණ්ඩ, භාවිත අමුද්‍රව්‍ය ඇසුරෙන් නිර්මාණය කර ඇති අයුරු, විචිත්‍රවය සහ කලාත්මක බව පැහැදිලි කර ඇත්නම්
- ශිල්පීය ප්‍රාගුණ්‍ය කැටයම් කලාව ඇසුරෙන් අගය කළ යුතු බව

**රංග භාණ්ඩ දෙක නම් කිරීමට ලකුණු 02**
**විස්තර කිරීමට ලකුණු 04**
**මුළු ලකුණු 06**

(iii) සන්නි යකුමේ වෙස් මුහුණු සහ රංග වස්ත්‍රාභරණ භාවිතයෙහි විශේෂතා සූනියම් යක්ෂණියගේ චරිතය ඇසුරෙන් විග්‍රහ කරන්න.

- සූනියම් යක්ෂණියගේ චරිතය අවස්ථා තුනකින් සභා ගතවන බව
- සූනියම් යක්ෂණියගේ වෙස් මුහුණ අවස්ථා අනුව වෙනස් වන බව
- සූනියම් යක්ෂණිගේ චරිත නිරූපණය කිරීම සඳහා ඇඳුම් පැලඳුම් සහ වර්ණ භාවිතයේ විශේෂතා ඇති බව
- වෙස් මුහුණුවල (අර්ධ වෙස් මුහුණු) අවස්ථානුකූලව රස භාව ඉස්මතු කර ඇති බව

**චරිතය ඇසුරින් වෙස් මුහුණු භාවිතයේ විශේෂතා විග්‍රහ කිරීමට ලකුණු 04**
**රංගවස්ත්‍රාභරණ භාවිතයේ විශේෂතා විග්‍රහ කිරීමට ලකුණු 04**
**මුළු ලකුණු 08**

4. (i) පොත්කඩේ යක්කම ඇසුරෙන් සන්නිවේදනය වන සමාජ සාරධර්ම දෙකක් විස්තර කරන්න.

- සෑම සුභ කටයුත්තකදීම බුලත් හුරුල්ලක් දී ආරාධනා කිරීම චාරිත්‍රයක් බව
- එකමුතුකම, සහයෝගය, සුහදතාව හා විශ්වාසයෙන් කටයුතු කිරීම වැදගත් බව
- බහු විවාහ හා සබදතා සමාජයට නුසුදුසු බව
- සමාජ විශ්වාස පිළි ගැනීම වැදගත් බව
- අන්‍යෝන්‍ය වශයෙන් ගෞරව කරන බව

**සමාජ සාරධර්ම දෙකක් තෝරා ගැනීමට ලකුණු 02**
**විස්තර කිරීමට ලකුණු 04**
**මුළු ලකුණු 06**

(ii) බලි උපත් කතා දෙකක් නම් කොට බලි ශාන්තිකර්මය පැවැත්වීමේ අවස්ථා දෙකක් පිළිබඳ පැහැදිලි කරන්න.

බලි උපත් කතා

- ලිච්ඡවි කුමරු සම්බන්ධ බලි උපත
- විජය කුවේණි සම්බන්ධ බලි උපත
- මහා සම්මත රජුන් කල බලි උපත
- බුදුන් කල තුන්බිය වත් කල විශාලාවේ බලි උපත

පැවැත්වීමේ අවස්ථා

- ග්‍රහ අපල දුරු කිරීම
- දරුවකු පිළිසිඳ ගැනීමේ අවහිරතා මගහරවා ගැනීම
- නියඟය
- කලඑළි මංගල්‍යය ................ආදි අවස්ථා

**බලි උපත් කතා දෙක නම් කිරීමට ලකුණු 02**
**පැවැත්වීමේ අවස්ථා දෙකක් විස්තර කිරීමට ලකුණු 04**
**මුළු ලකුණු 06**

(iii) පීරියක් චරිත නිරූපණයේ නාට්‍යමය ලක්ෂණ **හතරක්** ඇසුරෙන් රස නිෂ්පත්තිය විමසුමට ලක් කරන්න.

- සමාරෝපය
- අනුකරණය
- අනුරූපණය
- දෙබස්
- රංගවස්ත්‍රාභරණ
- රංගභාණ්ඩ
- චරිත, අවස්ථා ,සිද්ධි නිරූපණ
- සතර අභිනය

ඉහත කරුණු ඇසුරෙන් විවිධ රස නිෂ්පත්තිය සිදුවන අයුරු විමසුමට ලක් කර ඇත්නම්

**නාට්‍යම අවස්ථා හතරක් නම් කිරීමට ලකුණු 04**
**රස නිෂ්පත්තිය ඇසුරෙන් විමසුමට ලක් කිරීමට ලකුණු 04**
**මුළු ලකුණු 08**

**5.** (i) පතල් කවි පිළිබඳ හැඳින්වීමක් කර එම කවි භාවිතයෙන් නිර්මාණය වී ඇති ගැමි නැටුම පිළිබඳ විස්තරයක් කරන්න.

**පතල් කවි හැඳින්වීම**

- පතල් කර්මාන්තය හා බැඳි ගායනා විශේෂයක් බව
- රැකියාවේ කටුක බව හා දොම්නස ප්‍රකාශ වන බව
- එහි අසීරු හා භයානක ස්වභාවය කවියෙන් විස්තර වන බව
- පහසුවෙන් ගායනා කළ හැකි නාදමාලාවක් නොමැති බව
- පතල තුළදී ඇතිවන කාන්සිය, දුක, පාළුව ආදී සංවේදී සිතුවිලි එම ගායනාවලින් විචිත්‍රත්වය ඉදිරිපත් කරන බව

**ගැමි නැටුම**

- පතල් කර්මාන්තයේ වෘත්තීය ස්වාභාවය නිරූපණය වන බව
- ගැමි නැටුමක් ලෙස නිර්මාණය වී ඇති බව
- මිණිරන් /මැණික් කර්මාන්තයෙහි ක්‍රියාකාරකම් නර්තනය මඟින් නිර්මාණාත්මකව ඉදිරිපත්වන බව
- චලන, රංගවස්ත්‍රාභරණ, රංගවින්‍යාසය, ගායන, වාදන හා උපකරණ භාවිතවන බව

**පතල් කවි හැඳින්වීමට ලකුණු 02**
**ගැමි නැටුම විස්තර කිරීමට ලකුණු 04**
**මුළු ලකුණු 06**

(ii) නොංචි චරිතය නිර්මාණය සඳහා ගායනා සහ නර්තන උපයෝගි කරගෙන ඇති අයුරු පහදන්න.

**ගායනයේදී**

- කෙටි කවි මගින් නොංචි චරිතය හඳුන්වා දෙන බව
  *නොංචි කර වරුණේ - පුංචි වයසත් පසු වෙමිනේ.......
  * කටේ දත් වැටෙමින- කබත් කුණු කෙලත් පෙරමින........
  *නිවස නැත දන්නේ - සවස ගෙදරින් එන්නේ.........
- අනාසාතාත්මකව ඉදිරිපත්වන කවි මගින් චරිත ලක්ෂණ තිව්‍රව ඉදිරිපත් වන බව

**නර්තනයේදී**

- පහතරට නර්තනයේ මාත්‍රා පහට අයත් දෙතාලය නර්තනයේ භාවිත බෙර පද මෙම චරිතයට යොදා ගෙන ඇති බව
  "දොංත ගතම් දොංත ගති ගතම්......"
  පහතරට බෙරය යොදා ගනිමින් ශාස්ත්‍රීය පද වාදනය කරන බව
- නර්තන ශිල්පියෙකු කාන්තා චරිතය නිරූපණය කරන බව
- සැම අවස්ථාවකදීම රෙද්ද හැට්ටය සකස් කිරිම,
  කොණ්ඩය බැඳීම,
  උකුණන් ගැනීම,
  බුලත් කෙටීම,
  විට කෑම,
  ස්වාමියා සෙවීම,
  සැමියා රැගෙන යාම.... ආදි අවස්ථාවන්හිදී තාලානුකූල බෙරපද අනුව චරිත ලක්ෂණ තිව්‍ර වන පරිදි නර්තන චලන භාවිතා කරන බව
- බුලත් කෙටීම වැනි අවස්ථානිරූපනයේ දී " තත් ගුද ගත..." වැනි බෙර පද උචිත පරිදි වාදනය කරමින් නර්තනය සමග චරිත නිරූපනය කරන බව

**ඉහත කරුණු ඇසුරෙන්,**

**ගායනය උපයෝගි කර ගෙන ඇති අයුරු පැහැදිලි කිරීමට ලකුණු 03**
**නර්තනය උපයෝගි කරගෙන ඇති බව පැහැදිලි කිරීමට ලකුණු 03**
**මුළු ලකුණු 06**

(iii) අද්‍යතනයේ දැකිය හැකි බොහෝ ගැමි නැටුම් එහි මූලික ලක්ෂණ අතික්‍රමණය කරයි. පහත තේමා යටතේ පැහැදිලි කරන්න.

(අ) රංගවින්‍යාස සහ ඇඳුම් පැළඳුම්

(ආ) ගායන හා වාදන

**රංග වින්‍යාසය හා ඇඳුම් පැලඳුම්**

- රංග වින්‍යාසය සංකීර්ණ වී ඇති බව
  (අවකාශය, චලන, තල , දිසා, රටා හා සම්බන්ධතා භාවිතය)
- තේමාව අතික්‍රමණය වී ඇති බව
- සංකීර්ණ ඇඳුම් පැලඳුම් භාවිත කරන බව
  (වර්ණ, ගල්, රිබන්, පබළු, රබර් ෂීට්, ලෝහ වර්ග)

**ගායනා හා වාදන**

- පෙරදිග හා අපර දිග සංගීතය භාවිතා වන බව
- සංකීර්ණ වූ ස්වර පරාස මුසු කර ගන්නා බව
- සංකීර්ණ තාලරූපවලට අනුව ගායනා ඉදිරිපත් කරන බව
- අර්ථ රසය ඉක්මවා ශබ්ද රසය ඉස්මතුවන බව
- විවිධ වාද්‍ය භාණ්ඩ භාවිත කරන බව
- සරල බෙර පද ඉක්මවා ශාස්ත්‍රීය පද වාදනය වන බව
- පටිගත කළ සංගීත ඛණ්ඩ භාවිත වන බව

රංග වින්‍යාසය හා ඇඳුම් පැළඳුම් යටතේ පැහැදිලි කර ඇත්නම් ලකුණු **04**

ගායනා හා වාදන යටතේ විස්තර කිරීමට ලකුණු **04**

## III කොටස

**6** (i) (අ) කොටස - භරත නාට්‍යයම් නර්තන සම්ප්‍රදායට අයත් නෘත්ත ලක්ෂණ ඇති නර්තන අංගය තෝරාගෙන එහි විශේෂතා පැහැදිලි කරන්න.

**තිල්ලානා**

- භරත නාට්‍යම්වල මෙය නෘත්ත ගණයට අයත් ඉතා සංකීර්ණ නර්තන අංගයක් බව
- තාලය හා ලය ප්‍රධානවන බව
- අංග, ප්‍රත්‍යාංග, උපාංග භාවිත කරමින් නෘත්ත විලාශයක් ඉදිරිපත් කරන බව
- අඩව්වලින් ආරම්භවන තිල්ලානා ජති කිහිපයකින් සමන්විතවන බව
- ධීම්, ධිරනා, තනදිරනා, තදෘත ....... ආදි පද මූලික කරගෙන ගායනය නිර්මාණය වී ඇති බව
- මෙම අංගය හඳුන්වා දී ඇත්තේ පොන්නයියා විසින් බව

නිවැරදිව තෝරා ගැනීමට ලකුණු **02**

විශේෂතා පැහැදිලි කර ඇත්නම් ලකුණු **04**

මුළු ලකුණු **06**

(ii) (ආ) කොටස - කථක් නර්තන සම්ප්‍රදායයෙහි භාවිත අවනද්ධ වාද්‍ය භාණ්ඩය තෝරාගෙන එහි ව්‍යුහය පිළිබඳ විග්‍රහ කරන්න.

**තබ්ලාව**

- කථක් නර්තනයේ ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය බව
- කොටස් දෙකකින් සමන්විතවන අතර දකුණු කොටස **දහිනා** හෙවත් **දායන්** ලෙසද, වම් කොටස **බායං** හෙවත් **ඩග්ගා** නමින් හඳුන්වන බව
- දහිනා කොටස කොහොඹ, කොස් ආදි ලී වර්ගවලින් තනා ඇති බව
- බායං කොටස අතීතයේදී මැටියෙන් තනා ඇති අතර පසු කාලීනව තඹ හෝ පිත්තලයෙන් තනා ඇති බව
- දහිනා හම් කොටස **පූඩි** නමින්ද හඳුන්වන අතර එහි මැද කළු පැහැති බදාමය **සායාහි** නම් වන බව
- දහිනා උසින් අඟල් 12 -16 අතර ප්‍රමාණයක් වන අතර විශ්කම්භය අඟල් 6-7ක් පමණ වන බව
- වරපට **බන්ධි** නමින් ද එය තද කර ගැනීම සඳහා භාවිත ලී කැබලි **සට්ඨා** නමින් ද හඳුන්වන බව

නිවැරදි අවනද්ධ භාණ්ඩය තෝරා ගැනීමට ලකුණු **02**

ව්‍යුහය පිළිබඳ විග්‍රහ කිරීමට ලකුණු **04**

මුළු ලකුණු **06**

(iii) (ඉ) කොටස - ක්‍රි.ව. 1892 දී රුසියාවේ වේදිකාගත වූ බැලේ නාට්‍ය නම් කර එහි එන සාදයට එක්වන ආගන්තුක චරිතය හා සම්බන්ධ අද්භූත සිදුවීම් විමසුමට ලක් කරන්න.

**ද නට් ක්‍රැකර්**

- ආගන්තුකයා **හර් ඩ්රොසල්මේයර්** වන බව
- ක්ලාරාගේ සහෝදරයා සහ ඔහුගේ යාළුවන් එක්ව කඩා දැමූ බෝනික්කා, ආගන්තුකයා විසින් යථාතත්වයට පත් කළ බව
- නත්තල් ගස වැසීමට සැලැස්වූ අවස්ථාවක් ඇති බව
- නට් ක්‍රැකර් කඩවසම් කුමරුකු බවට පත්කිරීමේ සිදුවීමක් ඇති බව
- නට් ක්‍රැකර් පැමිණීමත් සමඟම රස කැවිලි සහ මල් අතුරුදහන් වීමේ සිදුවීම ඇති බව

නිවැරදිව බැලේ නාට්‍ය නම් කිරීමට ලකුණු **02**

ආගන්තුක චරිතය හා බැඳි අද්භූත සිදුවීම් තුනක් විමසුමට ලක් කිරීමට ලකුණු **06**

මුළු ලකුණු **08**

7. (i) තිත් පහන් (Spot Light) සහ අනුගාමී පහන් (Follow Light) පිළිබඳ හැඳින්වීමක් කරන්න.

**තිත් පහන් (SPOT LIGHT)**

- නූතන වේදිකා ආලෝකකරණයේදී භාවිත ප්‍රධාන පහන් වර්ගයක් බව
- වේදිකාවේ එක්තරා ප්‍රදේශයක්, ස්ථානයක්, පුද්ගලයකු, ද්‍රව්‍යයක් හෝ වේදිකා උපකරණයක්, ආලෝකය මඟින් සුවිශේෂව වෙන් කර දැක්වීමට පමණක් යොදා ගන්නා බව
- යොමු පහන් නමින්ද හඳුන්වන බව
- කාචයක් සහිත ලාම්පු වර්ගයක් බැවින් ආලෝක අඩු වැඩි කිරීම සඳහා භාවිත කළ හැකි බව

**අනුගාමී පහන් (FOLLOW LIGHT)**

- නූතන වේදිකා ආලෝකකරණයේදී භාවිත ප්‍රධාන පහන් වර්ගයක් බව
- වේදිකාවේ රංගන ශිල්පීන් එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට ගමන් කිරීමේදී හෝ කිසියම් ඉලක්කයක් වෙතට යෑමේදී ඒ සමඟ ආලෝක ධාරාවක් ගමන් කරවීමට යොදා ගන්නා ආලෝක පහන් වර්ගයක් බව
- මෙම පහන් ආලෝකකරණ ශිල්පීන්ට අතින් හැසිරවිය හැකි අතර දුරස්ථ පාලක මඟින් ද හැසිරවිය හැකි මෙම වර්ගයේ ආලෝක පහන් ඇති බව

**තිත් පහන් පිළිබඳ හැඳින්වීමට ලකුණු 03**

**අනුගාමී පහන් පිළිබඳ හැඳින්වීමට ලකුණු 03**

**මුළු ලකුණු 06**

(ii) නර්තනය සඳහා අංගරචනය කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු **තුනක්** විස්තර කරන්න.

- මුහුණේ සහ සිරුරේ බාහිර පෙනුම පිළිබඳ සැලකිලිමත් විය යුතු බව
- නර්තනයේ ස්වභාවය හා ප්‍රස්තුතය අනුව අංග රචනය කළ යුතු බව
- නර්තන ශිල්පියාගේ මාංසපේශී සැකැස්ම හැඩය හා වර්ණය සැලකිල්ලට ගෙන අංගරචනය සිදුකළ යුතු බව
- වේදිකාවේ ස්වභාවය හා අවකාශය පිළිබඳ සැලකිලිමත් විය යුතු බව
- ආලෝකකරණයට ගැළපිය යුතු බව
- රංගවස්ත්‍රාභරණ
- ප්‍රේක්ෂාගාරය

**කරුණු තුනක් ඇසුරෙන් විස්තර කිරීමට (2x3) ලකුණු 06**

**මුළු ලකුණු 06**

(iii) ශෛලිගත නාට්‍ය සහ තාත්වික නාට්‍ය ශෛලීන්හි සමවිෂමතා කරුණු **හතරක්** ඇසුරෙන් විමසුමට ලක් කරන්න.

| සමානතා | අසමානතා |
|---|---|
| නාට්‍ය පිටපතක් පදනම් කර ගැනීම | තාත්වික නාට්‍ය - ස්වභාවිකත්වය මූලික වන බව<br>ශෛලිගත නාට්‍ය - අතිශයෝක්තිය සහ අලංකාරය ලක්ෂණ ඇති බව |
| සතර අභිනය මත පදනම් වී ඇති බව | තාත්වික නාට්‍ය - සරල, ව්‍යවහාරික භාෂාව භාවිත කරන බව<br>ශෛලිගත නාට්‍ය - සම්භාව්‍ය හා කාව්‍යමය භාෂා රටා භාවිත කරන බව |
| ගීත, සංගීත ඛණ්ඩ සහ නර්තන අංග යොදා ගන්නා බව | තාත්වික නාට්‍ය - ස්වභාවිකත්වයට නැඹුරු වූ වේෂභූෂණ භාවිත කරන බව<br>ශෛලිගත නාට්‍ය - අතිශයෝක්ති වේෂභූෂණ භාවිත කරන බව |
| චරිත නිරූපණය මඟින් අර්ථවත් භාව ප්‍රකාශන යොදා ගන්නා බව | තාත්වික නාට්‍ය - ස්වභාවික වේදිකා සැරසිලි භාවිත කරන බව<br>ශෛලිගත නාට්‍ය - වේදිකා සැරසිලිවලින් තොරව එය කාව්‍ය වර්ණනා, දෙබස්, චලන මඟින් ඉටු කරන බව |
| අනුකරණය, අනුරූපණය හා සමාරෝපය ඇති බව | තාත්වික නාට්‍ය - තාත්වික චරිත නිරූපණය සිදු කරන බව<br>ශෛලිගත නාට්‍ය - ශෛලියකට ස්වරූපයෙන් චරිත නිරූපණය සිදුවන බව |
| චරිත, අවස්ථා හා සිද්ධි නිරූපණය කරන බව | තාත්වික නාට්‍ය - උදා. මඟුල් ප්‍රස්ථාව, කැළණි පාළම, බෝඩිංකාරයෝ<br>ශෛලිගත නාට්‍ය - උදා. මනමේ හා සිංහබාහු |

**සමානතා හා විෂමතා කරුණු හතරක් නම් කිරීමට ලකුණු 04**

**කරුණු හතර විමසුමට ලක් කිරීමට ලකුණු 04**

**මුළු ලකුණු 08**

**8.** (i) "අද්‍යතන රියැලිටි නර්තන නිර්මාණ මගින් පුද්ගල රසඥතා වර්ධනය සිදුවේ ද?" ඔබගේ අදහස් දක්වන්න.

- අද්‍යතන රියැලිටි වැඩසටහන් හඳුනා ගෙන ඇති බව
  ඩාන්සින් ස්ටාර්, හිරු සුපර් ඩාන්සර්, ලිට්ල් ස්ටාර්.............
- රංගවින්‍යාසය, රංගවස්ත්‍රාභරණ, සංගීත නිර්මාණය, ගායනය, වාදනය, අංගරචනය හා තාක්ෂණික ශිල්ප ක්‍රම භාවිතය ඇසුරින් අද්‍යතන රියැලිටි නර්තන නිර්මාණ මගින් රසඥතා වර්ධනය සිදුවන බව හෝ නොවන බව පිළිබඳ අදහස් දක්වා තිබීම.

**වැඩසටහන් නම් කිරීමට ලකුණු 02**
**පුද්ගල රසඥතා වර්ධනය වී ඇති අයුරු දැක්වීමට ලකුණු 04**
**මුළු ලකුණු 06**

(ii) රූපවාහිනී මාධ්‍යයන්හි වෙළඳ දැන්වීම් සඳහා නර්තනය යොදාගෙන ඇති අයුරු උදාහරණ **දෙකක්** ඇසුරෙන් සාකච්ඡා කරන්න.

- නර්තනය යොදා ගෙන ඇති රූපවාහිනී වෙළඳ වැඩසටහන් හඳුනා ගෙන ඇති බව
  උදා;- ක්‍රීම් සෝඩා, සන්ලයිට්, ලයිෆ් බෝයි, රොසෙල් ටයිල් ............යනාදී වැඩ සටහන්
- තේමාව සංවර්ධනය, නර්තන ශෛලිය, රංගවස්ත්‍රාභරණ හා පසුබිම් සංගීතය ආදී කරුණු දෙකක් පිළිබඳ සාකච්ඡා කර ඇති බව

**නර්තනය යොදාගෙන ඇති වෙළඳ දැන්වීම් දෙකක් දක්වා තිබීමට ලකුණු 02**
**කරුණු දෙකක් සාකච්ඡා කිරීමට ලකුණු 04**
**මුළු ලකුණු 06**

(iii) ශාස්ත්‍රීය නර්තනය ආරක්ෂා කරගැනීම උදෙසා සමාජ මාධ්‍ය මගින් ඔබට ඉටුකළ හැකි කාර්යයන් **හතරක්** විමසන්න.

- YouTube" ,Instagram" Facebook වැනි වේදිකාවල ශාස්ත්‍රය නර්තන අංග සහ ප්‍රසංගවල වීඩියෝ පළ කිරීම.
- ශාස්ත්‍රීය නර්තන අංග, ප්‍රසංග පිළිබඳ ගැඹුරු ඇගයීමක් ලබා දීමට ඒ සඳහා සූදානම් වීමේ ක්‍රියාවලිය ප්‍රචාරය.
- ශාස්ත්‍රීය නර්තන සම්ප්‍රදායයන්හි ඉතිහාසය, වැදගත්කම පිළිබඳ ස්වකීය අදහස් හුවමාරු කිරීම.
- ශාස්ත්‍රීය නර්තනය සඳහා අවධානය ආකර්ෂණය කර ගැනීමට, අදාළ ඡායාරූප පළ කිරීම.
- පුද්ගලික අත්දැකීම් සහ ශාස්ත්‍රීය නර්තනයේ වැදගත්කම පිළිබඳ අත් පත්‍රිකා සමාජ මාධ්‍යය මගින් හුවමාරු කර ගැනීම
- ශාස්ත්‍රය නර්තන වැඩමුළු, හෝ සංස්කෘතික සිදුවීම් පිළිබඳ තොරතුරු බෙදා ගැනීම සඳහා සමාජ මාධ්‍යය වෙත යොමු කිරීම.
- ශාස්ත්‍රීය නැටුම් ඉගැන්වීමට හෝ සාකච්ඡා කිරීමට සජීවී සැසි පැවැත්වීම.
- වැඩමුළු, ප්‍රසංග හෝ දේශන සඳහා විශාල ප්‍රේක්ෂක පිරිසක් ලබා කරවීම සඳහා දැන්වීම් ප්‍රචාරණය කිරීම .
- ශාස්ත්‍රීය නැටුම් සංරක්ෂණය කිරීමේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම සඳහා කෙටි වැකි පල කිරීම.
- ශාස්ත්‍රීය නර්තන නැටුම් චලනයන් හෝ නර්තන අංගවල කෙටි, ආකර්ශනීය වීඩියෝ Tik Tok ප්‍රචාරය.
- සමාජ මාධ්‍ය ගිණුම් හරහා ශාස්ත්‍රීය නර්තනයට අදාළ පොත්පත්, CD තැටි හෝ සිහිවටන අලෙවිය.
- ශාස්ත්‍රීය නර්තනය පිළිබඳ පර්යේෂණ ප්‍රකාශන බෙදාහැරීම

**සමාජ මාධ්‍ය මගින් ඉටු කළ හැකි කාර්යයන් හතරක් දක්වා ඇත්නම් ලකුණු 04**

**විස්තර කිරීමට ලකුණු 04**

**මුළු ලකුණු 08**

*****